# PRIME ENTRY BOOKS (Part-VI)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# විකුණුම් ජර්නලය හෙවත් විකුණුම් පොත

වෙළඳ භාණ්ඩ ණයට විකිණීම සටහන් කරනු ලබන මූලික සටහන් පොත විකුණුම් ජර්නලයයි.

# මූලාශ්‍ර ලේඛනය

විකුණුම් ජර්නලයට අදාළ මූලාශ්‍ර ලේඛනය **ඉන්වොයිසිය** වේ (විකුණුම් ඉන්වොයිසිය).

# වෙළඳ වට්ටම්

වෙළඳ භාණ්ඩ ණයට විකිණීමේ දී භාණ්ඩවල ලකුණු කළ මිලෙන් යම් ප්‍රතිශතයක් අඩු කරන අතර එය **වෙළඳ වට්ටම්** ලෙස හඳුන්වනු ලැබේ.

වෙළඳ වට්ටම් ඉන්වොයිසියෙන් අඩු කර දැක්වීම පමණක් සිදු කරයි. ගිණුම්ගත නොකරයි.

# වෙළෙඳ ණයගැතියන්

ව්‍යාපාරය භාණ්ඩ ණයට විකුණූ විට වෙළෙඳ ණයගැතියන් ඇතිවන අතර, එම ණයගැතියන් ව්‍යාපාරයේ වත්කම් ලෙස සැලකේ.

ClassWork.LK

# VAT ලියාපදිංචි ආයතනයක විකුණුම් ජර්නලයක ආකෘතිය

| දිනය | ඉන්වොයිසි අංකය | ගැනුම්කරු | වටිනාකම (රු.) | වැට් (රු.) | මුළු වටිනාකම (රු.) | ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|---|
| 2017/03/01 | 520 | දුමින්ද ට්‍රේඩර්ස් | ×× | × | ××× | |
| 2017/03/20 | 521 | කමල් හා සහෝදරයෝ | ×× | × | ××× | |
| 2017/03/31 | | පොදු ලෙජරයට පිටපත් කළා | ×× | × | ××× | |

ඒ ඒ දිනයන්හි VAT ඇතුළත් මුළු ණයගැති වටිනාකම ණයගැති උපලෙජයේ අදාළ ණයගැති ගිණුම්වලට වෙන් වෙන් ව හර කළ යුතුයි.

කාලච්ඡේදය අවසානයේ දී විකුණුම් ජර්නලයේ වටිනාකම් තීරුවේ එකතුව පොදු ලෙජරයේ විකුණුම් ගිණුමට බැර කළ යුතු අතර VAT තීරුවේ එකතුව VAT ගිණුමට බැර කර, පසුව VAT ද ඇතුළත් මුළු වටිනාකම තීරුවේ එකතුව ණයහිමි පාලන ගිණුමට හර කළ යුතුයි.

## විකුණුම් ජර්නලයේ එක් එක් එකතුව පොදු ලෙජරයට පිටපත් කිරීම

| | | |
|---|---|---|
| ණයගැති පාලන ගිණුම | හර | → VAT සහිත විකුණුම්වල මුළු වටිනාකම |
| වැට් ගිණුමට | බැර | → VAT තීරුවේ එකතුව |
| විකුණුම් ගිණුම | බැර | → විකුණුම් ජර්නලයේ වටිනාකම් තීරුවේ එකතුව |

ClassWork.LK

## ආපසු එවුම් ජර්නලය

ආපසු එවුම් සටහන් කිරීම සඳහා භාවිත කරන මූලික සටහන් පොත ආපසු එවුම් ජර්නලය හෙවත් ආපසු එවුම් පොත වේ.

## බැරපත

ආපසු එවුම් ජර්නලයේ ගනුදෙනු සටහන් කිරීමට පදනම් කර ගන්නා **මූලාශ්‍ර ලේඛනය බැරපත** වේ.

## ණයට විකුණූ වෙළඳ භාණ්ඩ ගනුදෙනුකරුවන් විසින් ආපසු එවීමට හේතු

- කාලය ඉකුත් වීම.
- ඇණවුමට අනුකූල නොවීම.
- නෂ්ට වූ භාණ්ඩ වීම.

ClassWork.LK

# ආපසු එවුම් ජර්නලයක ආකෘතිය

| දිනය | බැරපත් අංකය | ගැනුම්කරු | වටිනාකම (රු.) | වැට් (රු.) | මුළු වටිනාකම (රු.) | ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|---|
| 2017/03/06 | 13 | දුමින්ද ට්‍රේඩර්ස් | ×× | × | ×× | |
| 2017/04/25 | 14 | කුමාර සහ සහෝදරයෝ | ×× | × | ×× | |
| 2017/03/31 | | පොදු ලෙජරයට පිටපත් කළා | ×× | × | ×× | |

ඒ ඒ දිනයන්හි VAT ද ඇතුළත් මුළු වටිනාකම ණයගැති උපලෙජරයේ අදාළ ණයගැති ගිණුම්වලට වෙන් වෙන් ව බැර කළ යුතු යි.

කාලච්ඡේදය අවසානයේ ආපසු එවුම් ජර්නලයේ වටිනාකම් තීරුවේ එකතුව පොදු ලෙජරයේ ආපසු එවුම් ගිණුමට හර කළ යුතු අතර VAT තීරුවේ එකතුව VAT ගිණුමට හර කළ යුතු ය. පසුව VAT ද ඇතුළත් මුළු වටිනාකම් තීරුවේ එකතුව ණයගැති පාලන ගිණුමට බැර කළ යුතු ය.

# ආපසු එවුම් ජර්නලයේ එකතුව පොදු ලෙජරයට පිටපත් කිරීම

| | | | |
|---|---|---|---|
| ආපසු එවුම් ගිණුම | හර | → | වටිනාකම් තීරුවේ එකතුව |
| වැට් ගිණුම | හර | → | VAT තීරුවේ එකතුව |
| ණයගැති පාලන ගිණුම | බැර | → | VAT සහිත මුළු වටිනාකම් තීරුවේ එකතුව |

ClassWork.LK

## අභ්‍යාස

(01)

| ජ'නලය | සටහන් කෙරෙන ගනුදෙනු | මූලාශ්‍ර ලේඛනය |
|---|---|---|
| විකුණුම් ජ'නලය | ............................................. | ........................ |
| ආපසු එවුම් ජ'නලය | ............................................. | ........................ |

**(02)** ලී බඩු මිලට ගෙන නැවත විකිණීම සිදු කෙරෙන මොරටු ලී බඩු වෙළඳසැලේ විකුණුම් ජර්නලයේ සටහන් කෙරෙන ගනුදෙනුව / ගනුදෙනු තෝරන්න.

වසරක් ප්‍රයෝජනයට ගෙන තිබූ මෝටර් රථය රු. 350,000 කට සරත්ට විකිණීම.

රු. 35 000 ක පිරිවැය වූ ලී බඩු තොගයක් රු. 50 000 ක මුදලට විකිණීම.

විකිණීම සඳහා රු. 60 000 කට ලී බඩු තොගයක් සුරංග ව්‍යාපාරයෙන් මිල දී ගැනීම.

ලී බඩු තොගයක් විපුලට රු. 68 000 කට විකිණීම.

රු. 30 000 කට මිලට ගෙන තිබූ උපකරණ රු. 42 000 කට විකිණීම.

ClassWork.LK

(03) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය යන්න දක්වන්න.

ඒ ඒ බැරපතේ වටිනාකම ආපසු එවුම් ජ'නලයේ සටහන් කර අදාළ දිනයේ ම උප ලෙජරයේ ණයගැති ගිණුමට පමණක් බැර කරයි. (..........)

ව්‍යාපාරයක සිදුවන සියලුම විකුණුම් වටිනාකම විකුණුම් ජර්නලයක සටහන් කරයි. (..........)

(04) වෙළෙඳ භාණ්ඩ ණයට විකිණීමේ දී 10% ක_වෙළෙඳ වට්ටමක් අඩු කිරීම ඡ්ඹ සඳහා ලියාපදිංචි වූ ශාලිකා වෙළෙඳ ව්‍යාපාරයේ විකුණුම් ප්‍රතිපත්තියයි. 2017 මාර්තු මාසයේ මෙම ව්‍යාපාරයේ සිදු වු ගනුදෙනු පහත දැක්වේ.

| දිනය | විස්තරය |
|---|---|
| 2017/03/04 | ඉන්වොයිසි අංක 145 යටතේ සමනලීට විකුණුම් රු. 30 000 කි |
| 2017/03/08 | ඉන්වොයිසි අංක 146 යටතේ මාතලීට විකුණුම් රු. 45 000 කි. |
| 2017/03/10 | ඉන්වොයිසි අංක 147 යටතේ සඳමාලිට විකුණුම් රු. 28 000 කි |
| 2017/03/15 | 2017/03/10 වන දින සඳමාලිට විකුණු භාණ්ඩ සියල්ල ඉල්ලූ වර්ගයට වඩා වෙනස්වීම මත ආපසු එවා තිබුණි. (බැරපත් අංකය 18) |
| 2017/03/20 | ඉන්වොයිසි අංක 148 යටතේ සිරිමලීට විකුණුම් රු. 36 000 කි. |
| 2017/03/25 | 2017/03/20 වන දින සිරිමලීට විකුණු භාණ්ඩවලින් රු. 8 000 ක තොගය කල් ඉකුත්වීම මත ආපසු එවා තිබුණි. (බැරපත් අංකය 19) |
| | (සටහන් : සියලුම විකුණුම් VAT රහිත ව දක්වා ඇත. VAT ප්‍රතිශතය 15% කි) |

**අවශ්‍ය වන්නේ :**

විකුණුම් ජර්නලය හා ආපසු එවුම් ජර්නලය

අදාළ ලෙජර් ගිණුම් (පොදු ලෙජරය හා ණයගැති ලෙජරය)

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura